මගේ අංකය - JSC/SEC/CIR-L/2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන් , අධිකරණ නිලධාරීන් සහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

<u>සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි දීම සඳහා අධිකරණ වෙත තාක්ෂණික යටිතල පහසුකම් සැපයීම සම්බන්ධවයි</u>

නඩු ප්‍රමාදය වැළැක්වීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ බන්ධනාගාර ගත රැඳවියන් සාක්ෂිකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් දුරස්ථ ක්‍රමයට අධිකරණ වෙත ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි අධිකරණ අමාත්‍යාංශය විසින් දිවයිනේ සියලුම මහේස්ත්‍රාත් අධිකරණ සහ තෝරා ගත් දිසා /මහේස්ත්‍රාත් අධිකරණ වෙත වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල 100ක් ලබා දීමටත් ඒ හා සමගාමීව Support to Justice Sector ව්‍යාපෘතිය යටතේ UNICEF ආයතනය විසින් සියලුම මහාධිකරණ වෙත (අධිකරණ ශාලා 46) වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල ලබා දීමටත් සැලසුම් කරමින් පවතින බව අධිකරණ අමාත්‍යාංශය විසින් දැනුම් දී ඇත.

ඊට අදාලව මෙම වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල අධිකරණ ශාලාවක ස්ථාපනය කළ යුතු ආකාරය පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති දළ සටහනක් මේ සමග අමුණා ඇත.

ඒ අනුව මෙම උපකරණ කට්ටල අධිකරණ ශාලාවන්හි ස්ථාපිත කිරීමට හැකිවන අයුරින් අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඔබට දැන්වීමට අධිකරණ සේවා කොමිෂන් සභාව මට නියම කර ඇත.

ප්‍රසන්න අල්විස්

ලේකම්

අධිකරණ සේවා කොමිෂන් සභාව

Prasanna Alwis
Secretary
Judicial Service Commission
Colombo 12

2025 ඔක්තෝබර් මස 09 වෙනි දින

කොළඹ 12

අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

# FLOOR PLAN




| | | |
|---|---|---|
| | DISPLAY BOARD | ① |
| | MONITER BOARD | ② |
| | CAMERA | ③ |
| | CONTROLLING SYSTEM (CAMERA,MIC,SPEAKER,LAP TOP T.V ) | ④ |
| | MICK | ⑤ |
| | SPEAKERS | ⑥ |